# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1834/60 - 2013 නොවැම්බර් මස 01 වැනි සිකුරාදා - 2013.11.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ වවුනියා උතුරු ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

මිය යාම හේතු කොට ගෙන වවුනියා උතුර ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

දේවරාසා තිල්ලයිරාජා නම් වූ සභිකයා අයත් වන්නා වූ එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් වන්නා වූ ද, ඒ වවුනියා උතුර ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු නාම යෝජනා කිරීමට ඉහත කී, ආඥාපනතේ 65අ (2) වන වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු වන නාගලිංගම් ධර්මරාජා මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

වවුනියා උතුර ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී පොන්නුත්තුරයි කුගනාදන් වන මම, (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ (2) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, නාගලිංගම් ධර්මරාජා මහතා වවුනියා උතුර ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

පී. කුගනාදන්,
තේරීම්භාර නිලධාරී,
වවුනියා උතුර ප්‍රාදේශීය සභාව.

2013 ඔක්තෝබර් මස 15 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
වවුනියාව.

11 - 637

1A - G 18481 — 180 (2013/11)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ වලිකාමම් බටහිර ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතු කොට ගෙන වලිකාමම් බටහිර ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

වීරසිංකම් සිවකුමාර් නම් වූ සභිකයා අයත් වන්නා වූ ඉලංකෙයි තමිල් අරසු කච්චි නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් වන්නා වූ ද, ඒ වලිකාමම් බටහිර ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු නාම යෝජනා කිරීමට ඉහත කී, ආඥාපනතේ 65අ (2) වන වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු වන සණ්මුකලිංගම් සජේසන් මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

වලිකාමම් බටහිර ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී සිවසුබ්‍රමණියම් අච්චුදන් වන මම, (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ (2) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, සණ්මුකලිංගම් සජේසන් මහතා වලිකාමම් බටහිර ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

එස්. අච්චුදන්,
තේරීම්භාර නිලධාරී,
වලිකාමම් බටහිර ප්‍රාදේශීය සභාව.

2013 ඔක්තෝබර් මස 23 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
යාපනය.

11 - 638

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.